# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1980 / 13 - 2016 අගෝස්තු 15 වැනි සඳුදා - 2016.08.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

### හිමිකම් ලියාපදිංචි කිරීම

### සංශෝධන

**1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත**

(14 වන වගන්තිය)

උක්ත ශීර්ෂය යටතේ 2014 මැයි මස 26 වන දින අංක 1864/21 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ* ගැසට් පත්‍රයේ පළකරන ලද බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හෝමගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 448බී - වටරැක උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාශය තුළ වටරැක නමැති ගමේ පිහිටියා වූ ද, අංක 520028 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 21 හි කැබලි අංක 166 දරන ඉඩම් කොටස සම්බන්ධයෙන් එහි උපලේඛනයෙහි;

හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්ගේ තීරණ ප්‍රකාශයේ 448බී - වටරැක උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාශය යන්න ඉවත් කර 448 - වටරැක දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශය යන්න සහ

"විනිශ්චයන් සහ ඉන්ජෙන්ෂන් තහනම් අපේක්ෂාවෙන් ඇති උකස් හා බැඳීම් පිළිබඳ විස්තර" තීරුවට "කැබලි අංක 167 හි මාර්ග පරවශතා අයිතිය" සමඟ යන්න ඇතුළත් කර සංශෝධනය කරනු ලැබේ.

**කේ.ඒ.කේ. රංජිත් ධර්මපාල,**
හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්

2016 අගෝස්තු මස 10 වැනි දින,
බත්තරමුල්ල
රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර", අංක 1200/6,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

08-50

1A - G 24029 - 12 (2016/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*සැ.යු.-* මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.